**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය - 2013**

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාව 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ගිණුම්කරණය සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංග පද්ධතියේ දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඒ හේතුවෙන් හඳුනා නොගත් රු: 3,257,163 ක හර ශේෂයක් පොදු සංචිතයට හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් උපලේඛනය අනුව වර්ෂය තුළ සත්‍යය වශයෙන් මිලදීගත් ප්‍රමාණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මිලදීගැනීම් ප්‍රමාණය අතර රු.574,785 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව රු.751,961 ක් වූ සේවක ණය ශේෂ වසර ගණනාවක සිට අයනොවී පැවතුණි.

**2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2009 ජුනි 06 දිනැති අංක UGC/IUA/2/PGS/06 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය හා අංක - UGC/HR/6/1/13(I) දරන ලිපිය | පශ්චාත් උපාධි පාඨමාලා බාහිර කථිකාචාර්ය දේශන ගාස්තු පැයක රේටය රු. 2,500 ක උපරිමයකට සීමා විය යුතු වු අතර එහි උපරිම සීමාව විශ්වවිද්‍යාල සනාථන සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු වුවද පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ බාහිර කථිකාචාර්ය දේශන ගාස්තු වශයෙන් විශ්වවිද්‍යාල සනාථන සභාවේ අනුමැතියකින් තොරව දේශන පැයකට රු.4,000 බැගින් රු.1,134,594 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2013 දෙසැම්බර් 31 දිනැති අංක පීඊ/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) අරමුදල් කලමනාකරණය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමකින් තොරව රු.5,782,431 ක් වටිනා අරමුදල් පවත්වාගෙන ගොස් තිබුණි.<br><br>(ii) චක්‍රලේඛයේ 4.1 ඡේදය පරිදි අරමුදල් සඳහා වාර්ෂික අයවැය ලේඛනය සකස් කර අවශ්‍ය අනුමැතීන් ලබාගෙන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමකින් තොරව අරමුදල් වලින් වියදම් නොදැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එකී නියමයන් පිළිපැදීමකින් තොරව පර්යේෂණ අරමුදලින් රු.6,036,754 ක වියදම් දරා තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශුද්ධ අගය රු.152,125,608 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) 2011 අප්‍රේල් 20 දිනැති අංක 1/2011 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය | අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා ගෙවා තිබූ රු.5,620,750 ක පර්යේෂණ දීමනා චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව ගෙවූ බවට තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.75,145,031 ක අතිරික්තයක් වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.98,289,177 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.23,144,146 කින් අඩුවීමට ආදායම වැඩිවීමට වඩා වියදම් රු.21,725,145 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්යය සාධනය**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ තථ්‍ය කාර්යසාධන වාර්තා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**4.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් පරිදි මූලික පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර, එකී සංග්‍රහයේ 7.9.11 පරිදි කාර්යසාධන හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය, පවතින මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ප්‍රසම්පාදන අංක UCSC/QUA/ADM/2012/134 යටතේ අසාමාන්‍ය අතාත්වික අනුප්‍රමාණයන් සහිත අවම ලංසුවකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2013 ජනවාරි 31 දිනට අවසන් වාර්තා ආයතනය වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ කිරීමකින් තොරව රු.112,500 ක් 2013 ඔක්තෝබර් 30 දින එම ආයතනයට ගෙවා තිබූ අතර මෙම කාර්ය අදාල ආයතනය වෙතින් ඉටු කරවා නොගෙන ආයතනයේ කාර්යමණ්ඩලය යොදවාගෙන නැවත ඉටුකෙරෙමින් පැවතුණි.

(ආ) ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 06 දෙනෙකුගෙන් රු13,214,866 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගිවිසුම් කඩ කළ ආචාර්යවරයෙකුගෙන් ආයතනයට අයවිය යුතුව තිබූ රු.1,277,930 ක් 2012 ඔක්තෝබර් 15 දින ආචාර්යවරයාගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර තිබියදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2004 නොවැම්බර් 01 දින සේවය හැර ගිය ආචාර්යවරයෙකුගෙන් රු.3,440,576 ක් අයවිය යුතු වුවත් නීත්‍යානුකුලව කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් ආචාර්යවරයා පදිංචි ලිපිනය සොයාගැනීමට නොහැකිවී තිබුණ අතර, අදාල මුදල් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් රු.4,583,131 ක මුදලක් විශ්විද්‍යාල අර්ථසාධක මුදලින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අරමුදල් ශේෂය වර්ධනය වී තිබූ නමුත් බැඳුම්කර වටිනාකම නොවෙනස්ව පැවතිණි.

(ඈ) අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් ආයතනයට අයවිය යුතු වටිනාකම් අයකර ගැනීමට සඳහා නීතිමය පියවර ගැනීමට වසර 1 සිට වසර 4 දක්වා කාල පරාසයක් ගතකිරීම හේතුවෙන් මුදල් අයකරගැනීමේ හැකියාව අවධානමකට ලක්ව තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අපහරණය කළයුතු වත්කම් නිශ්චිත හඳුනාගැනීමකින් තොරව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත සමාලෝචිත වර්ෂය තුළ ආයතනය සතු රු.10,922,096 ක් වූ වත්කම් අපහරණය කර තිබුණි.

**4.4 නිශ්ක්‍රීය අරමුදල්**

විවිධ ව්‍යාපෘති යටතේ පසුගිය වර්ෂ 08 ක කාලයක් තුළ ආයතනය වෙත ලැබුණු ප්‍රයෝජනයට නොගත් රු.47,964,739 ක අරමුදල් ගෙවියයුතු ගිණුම් යටතේ ඉදිරියට ගෙන එමින් තිබුණි.

**4.5 සීමිත තීක්ෂණ සමාගම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වෙනි වගන්තියට අනුකූලව ආයතන නියමාවලිය මගින් ස්ථාපිත කර ඇති පරිගණක සේවා මධ්‍යස්ථානයේ අරමුණු, පරමාර්ථ හා කාර්යභාරයන්ට සමගාමීව සෘජුවම තරගකාරීත්වයක් ඇති වන පරිදි 2002 අංක 01 දරන නියමාවලියේ 18 වැනි වගන්තියට පටහැනිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනයේ හා කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි සමාගම් පනත යටතේ සීමාසහිත තීක්ෂණ සමාගම පිහිටුවා තිබුණි.

(ආ) සීමාසහිත තීක්ෂණ සමාගම සමාලෝචිත වර්ෂය සඳහා රු.10,327,760 ක ආදායම් උපයා තිබූ අතර උපදේශන දීමනා වශයෙන් රු.7,129,852 ක් (සියයට 70) කාර්යමණ්ඩලය අතර බෙදා දී තිබුණි. සමාගමේ ස්ථාවර වත්කම් වටිනාකම රු.134,405 ක් වූ අතර එදිනෙදා කාර්යසාධනයේ දී තීක්ෂණ සමාගමේ පවතින වත්කම් අනුව මෙහෙයුම් කටයුතු සඳහා ආයතනයේ සම්පත් යොදා නොගන්නා බවට විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

**05. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) වත්කම් පාලනය
(ආ) ගිවිසුම් හා බැඳුම්කර
(ඇ) ප්‍රසම්පාදන කටයුතු
(ඈ) අරමුදල් පාලනය